# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.09.13

වේලාව : ප.ව. 02.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

1) **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මිය - ප්‍රධාන ලේකම් (බ.ප).**
2) **පී. සෝමසිරි මයා - ආණ්ඩුකාර ලේකම් (බ.ප).**
3) **වී. රාජපක්ෂ මිය - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).**
4) **හේමන්ත සමරකෝන් මයා - සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).**
5) **එම්.ඒ.බී.ඩී.සෙනරත් මයා - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).**
6) **එස්.ජී. විජයබන්දු මයා - ලේකම්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප).**
7) **ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).**
8) **ප්‍රදීප් රත්නායක මයා - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප).**
9) **එස්.නිල්වල මයා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).**
10) **කේ.කේ. චම්පිකා කනේරු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).**
11) **සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).**
12) **බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).**
13) **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).**
14) **ආර්.ඒ.ටී.ආර්.රාමනායක මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්).**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ලේ ඉදි කරමින් පවතින නව කාර්යාලය පිළිබඳ ව ප්‍රධාන ලේකම් ඇතුළු සියලු ම ලේකම්වරුන් දැනුවත් කිරීමක් සිදු කෙරුණු අතර, නව පරිශ්‍රයේ ආයතනික ව්‍යූහය, බිම් සැලැස්ම පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන ලදි. ස්ථානීය පරීක්ෂාවක් කඩිනමින් සිදු කිරීම පිළිබඳ අවධානය යොමු විය.<br><br>මේ වන විට සුළු ප්‍රමාදයක් ඇතත්, 2017 ඔක්තෝබර් මස වන විට වැඩ අවසන් කළ හැකි බවට විශ්වාසය පල කෙරිණි.<br><br>කඩිනමින් කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.<br><br>වාහන නැවැත්වීම සඳහා බස් නැවතුම් පොළ භූමිය ලබා ගැනීම සහ ඒ සඳහා වෙනත් ඉඩමක් ලබා දීම සඳහා නැවතත් අවධානය යොමු කිරීම. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම | දැනට පවතින පුරප්පාඩු ප්‍රමාණය පිරවීමට පුවත්පත් දැන්වීමක් යෙදීම සඳහා නොපමාව කටයුතු කිරීම. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 03. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පටිපාටිය සැප්තැම්බර් මස අවසන් වන විට සම්පූර්ණ කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 04. | නව වාහන මිල දී ගැනීම. | අමාත්‍යවරුන් හා ධුර ධාරීන් සඳහා වාහන කුලියට ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔක්තෝබර් 15 වන විට අවසන් කර ණයවර ලිපි විවෘත කිරීම. | අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සහා ලේකම්. |
| 05. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය | මින් ඉදිරියට පළාත් සභාවේ ස්ථාවර තැන්පතු පවත්වාගෙන නොයන බැවින්, අමාත්‍යාංශ ලේකම්වරු විධිමත් මූල්‍ය කළමනාකරණයක් සඳහා යොමු වීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදි.<br><br>මේ වන විට පවත්නා ස්ථාවර තැන්පතු යොදවා කතරගම හා නුවරඑලිය යන ප්‍රදේශ වල සංචාරක බංගලා 2ක්, ආණ්ඩුකාරතුමා වෙනුවෙන් නිල නිවසක් සහ ඉහල මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවාස සංකීර්ණයක් ඉදි කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන අමාත්‍ය තුමා උපදෙස් දුන් බව ප්‍රධාන ලේකම්තුමිය ප්‍රකාශ කරන ලදි.<br><br>එබැවින් නිල නිවාස මිල දී ගැනීමට මිල ගණන් | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය). |

| | | | |
|---|---|---|---|
| | | කැඳවීමට කටයුතු කිරීම.<br>නාරාහේන්පිට ඇති රජයේ ඉඩමේ තොරතුරු ඉදිරිපත් කිරීම. | |
| 06. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | මූල්‍ය ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා කටයුතු සිදු කිරීම.<br><br>ප්‍රගති සමාලෝචනය සඳහා සියලු ම අමාත්‍යාංශ යොමු කිරීම හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ පළාත් පාලන ආයතන ප්‍රධානීන් කැඳවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්තුමිය උපදෙස් ලබා දෙන ලදී. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) |
| 07. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | සැප්තැම්බර් 15 දින වන විට වෙබ් අඩවි වල පල කළ යුතු තොරතුරු නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත භාර දෙන ලෙසත්, පළාත් නිල වෙබ් අඩවිය දෙසැම්බර් මස වන විට භාෂාත්‍රයෙන් සකස් කර අවසන් කිරීමටත් ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 08. | තොරතුරු දන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම හා E-recording (SLT Server / Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | අමාත්‍යාංශ මට්ටමින් තොරතුරු දැන ගැනීමේ නිලධාරීන් පත් කිරීම සහ ආයතන මට්ටමින් ඒ සඳහා පසුබිම සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.<br><br>බස්නාහිර පළාත් සහා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, පළාතේ අනෙකුත් වෙබ් අඩවි සමඟ සන්ධානයක් (Link) ඇති කර ගැනීම, නිතර නිතර හැක් කිරීමට ලක් වීම නිසා ආරක්ෂාව තහවුරු කිරීම යන කාරණා සඳහා තෝරා ගන්නා ලද කමිටුව විසින් නිරීක්ෂණ හා යෝජනා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම.<br><br>ඔක්තෝබර් 15 වන විට තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට හැකි ඉක්මනින් කටයුතු කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදි. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09. | නිලධාරි දත්ත පද්ධතිය සකස් කිරීම | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේ දී ආයතනයක් තුල සේවය කරන නිලධාරීන්ගේ නාමයන් සහ සේවක අංක ඇතුළත් දත්ත වෙබ් පිටුවේ ප්‍රදර්ශනය කළ යුතු බැවින්, නිලධාරි දත්ත පද්ධතිය හැකි ඉක්මනින් සකස් කිරීමේ අවශ්‍යතාව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10. | "ජනපතිට කියන්න" වැඩසටහන | "ජනපතිට කියන්න" වැඩසටහන යටතේ 2016.09.02 දින වන විට පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලැබී ඇති ගැටලු 165න් 6 කට පමණක් විසඳුම් ලබා දී ඇති බව නි.ප්‍ර.ලේ.(පාලන) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කළ අතර, අමාත්‍යාංශ මට්ටමින් මේ සඳහා අවධානය යොමු | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් හා සියලු නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | | කළ යුතු බව ද, අවධාරණය කෙරිණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගැටලු විශාල ප්‍රමාණයක් අවසන් කර ඇති බව දක්වා තිබුණ ද, සත්‍ය වශයෙන් ම, අවසන් විසඳුම් ලබා දුන්නේද යන්න තහවුරු කර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කරන ලදී. | |
| 11. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ගේ සීඑම්/ඩබ්පී/සීඑම්ජ්/1/16 අංක දරණ 2016.05.30 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කරන ලද වාහන රක්ෂණය කිරීම සම්බන්ධ කරුණ. | පසුගිය ලේකම්වරුන්ගේ රැස්වීමේ දී පත් කළ කමිටුව විසින්, සංචිත වාහන රක්ෂණය කිරීමේ ප්‍රතිපත්තියට වඩා රක්ෂණය නොකිරීමෙන් වාහන අනතුරු ප්‍රමාණය අඩු වන බව ප්‍රධාන ලේකම් වෙත දැනුම් දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |

<u>**නව යෝජනා**</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | සංචාරක මණ්ඩලයේ නිලධාරීන් ප්‍රමාණවත් නොවීම. | පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ, ගණකාධිකාරී තනතුරු ඇතුළු නිලධාරී හිඟයක් පවතින බැවින්, ආයතන කටයුතු සිදු කිරීමේ දී විවිධ අවහිරතා මතු වේ. එබැවින්, එහි වර්තමාන තත්ත්වය හා නිර්දේශ / යෝජනා ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය. |
| 02. | ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා නව බස් රථයක් මිල දී ගැනීම. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා ආසන 42 බස් රථයක් මිල දී ගැනීම කෙරෙහි ඉදිරි කටයුතු සිදු කිරීම්. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 03. | 2017 වසරේ සිට ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීම. | 2017 වසරේ සිට අමාත්‍යාංශ වල ව්‍යාපෘති අනුමත කිරීම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පැවරීම සඳහා තීරණය කර ඇති බව සහ එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳ ව ඉදිරියේ දී ලිඛිත ව දැනුවත් කිරීමට කටයුතු කරන බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>මෙහි දී අදාළ අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන ගණන් දීමේ නිලධාරී) වෙත, ප්‍රධාන ලේකම් විසින් වාර්ෂික ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන වෙන් කර දීම සිදු කරන අතර, වසර පුරා ප්‍රධාන ලේකම් සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු වේ.<br><br>රු. මිලියන 25ට වැඩි ව්‍යාපෘති පළාත් මුල්‍ය රීති 80 යටතේ සැලසුම් කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 04. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් | ග්‍රාමීය ආර්ථික සංවර්ධන උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා යොදවන මුදලින් අවම වශයෙන් 25%ක් කාන්තාවන් සඳහා වෙන් කිරීම පිළිබඳ සඳහන් ලිපියට අනුව, ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී මේ පිළිබඳ සලකා බැලීමට දැනුම් දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 05. | විදේශ සංචාර සඳහා අරමුදල් භාවිතය | දේශපාලන නියෝජිතයන් හා පරිපාලන තනතුරු දරණ රජයේ නිලධාරීන් එකවර කණ්ඩායම් වශයෙන් විදේශ ගත වීම නුසුදුසු බව සහ එසේ යෝජනා සකස් කිරීමේ දී චාරිකා වල අවශ්‍යතාව පිළිබඳ මනා අධ්‍යනයක් සිදු කළ යුතු බව දන්වා ප්‍රධාන ලේකම් වෙත යොමු කල ලිපිය පිළිබඳ ලේකම්වරුන්ගේ අවධානය යොමු කරවන ලදි. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 06. | ටී.බී.ජයා සහිරා විදුහලේ ගොඩනැගිලි ඉදිකිරීම. | ටී.බී.ජයා සහිරා විදුහලේ ගොඩනැගිලි ඉදි කිරීමේ දී එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේ දී එක අංකයක් වෙනුවට විවිධ අංක 4ක් භාවිතා කර තිබීම නිසා ප්‍රතිපාදන වතුර්කරණය වී ඇත්දැයි පරීක්ෂා කර බැලීම. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 07. | සංග්‍රහ දීමනා වැඩි කිරීම. | ලේකම්වරුන්ට ගෙවනු ලබන සංග්‍රහ දීමනාව ප්‍රමාණවත් නොවන බැවින්, එම මුදල ඉහල දැමීම සඳහා වෙනත් නිලධාරීන් සඳහා ගෙවන දීමනා පිළිබඳ ව අධ්‍යනයක් කර වාර්තාවක් කැඳවීම. | සභා ලේකම්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**